# සබඳ

ගගන අභිශේක් යටිවාවල

ගගන අභිෂේක් යටිවාවල

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණිය යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝදමත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාව ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිම්පානන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන් “හෙරණ ගත්කරණී” ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි

ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලාතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සදහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය

විදුහල්පතිනිය
ශශිකලා සේනාධීර
මහාමයා බාලිකා විද්‍යාලය - මහනුවර

# පටුන


01. ආලෝකෝ උදපාදි
02. ආයෙමත්
03. විදුඅරුත් විදු මවුනි
04. සැඳෑ නුවර
05. මාවත ඉම දෙව් දරුවන්
06. මගේ සීයාට සුබ, නිරෝගිවත් උපන් දිනයක් වේවා!
07. කළු කුහරයක්
08. හෙළ උරුම
09. හිමියනි...
10. අකල් අනෝරා
11. සුනිල් සාන්තයනට.....
12. මුතු වළු පබළු
13. ගී මතින් කවි පෙළක්...
14. නො නිඳන මහනුවර
15. තිත
16. සුදු වැලි තලා
17. එදා කුසිනාරාවේදී
18. ජීවිත නෙබියුලාවේ
19. ජය මහ දුම්ඳු මුල
20. කොළොම්තොට අහස යට

# 01. ආලෝකෝ උදපාදි

රැය නුඹ තලාවෙහි නිසයුරු වී ය උදා
සිය සිය දහස් දෙව් බඹ පිරිවරති පුදා
දිය ගැබ සහස් සක්වළ අණසක විහිදා
කය සිත පහන් විණි ඉසිපතනෙ දි මිගදා

දස මර විජිනි තෙද බිඳ නැණ සර පතුරා
ගොස කර දහම් සක් නද ලොව් තිමිර ඉරා
යස දර පසග හිමිවරු භව බැමි උදුරා
මෙ සසර ජය ලදහ නිවනට වැඩ ඉඳුරා

චක්ඛුං උදපාදි ඤාණං උදපාදී
පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදී
සනසා සියල් සත මනු දෙව් බඹ ආදී
දම්සක් නදින් ආලෝකෝ උදපාදී

# 02. ආයෙමත්

තුරුළු වී සෙනෙහසේ සිහිනෙක ජීවිතය ගෙත්තම් කරන්නට
තෝරමින් බහ පේවෙමින් එහි හය හතර ආයෙත් උගන්නට
මලට ඇළ දොළ ගහකොළට නිල් අහස් තලයට පෙම් කරන්නට
ආස හිතෙනව සත්තමයි මට පුංචි කාලෙට ආයෙ යන්නට

මුව දොවා නිදිගැට හරින්නට අම්ම ගාවින් නො හෙල්ලෙන්නට
නැළැවෙන්න හිනැහෙන්න ඈ ළඟ කිරි සුවඳ ආයෙත් විඳින්නට
බටිත්තන් සූටික්කො එක්කන් අම්ම එනතුරු මග බලන්නට
ඇගෙ අතින් ගෙන වලා යහනා මතින් ඈතින් ඈත යන්නට

සිනාසී හැන්දෑවෙ දුවවිත් තාත්තගෙ දෙවුරේ නගින්නට
සෙනෙහසට මුසු දහදියෙන් වැළපෙන එ.දෙනුවන් සනසවන්නට
තාත්තත් එක්කන් ම ආයෙත් සුරතලින් දඟකම් කරන්නට
සරදමක කෙළිදෙළෙන් සැනැපී නිකැළැල් ව සොම්නස ලබන්නට

සිත්තම් ව අත්තම්ම ගාව ම ඇගෙ අතින් බත් කටක් කන්නට
මිදුලෙ ඈ හැදු මලට පැළයට ආදරේ රන් පැන් ඉහින්නට
හිනාවෙන් කවි කතාවෙන් මග ඇරුණු තැන් ආයෙත් දකින්නට
අත්තම්මගෙ ම අතේ එල්ලී පෝය දා පන්සලට යන්නට

රස සාර බර ආදරේ පිරි කතන්දර ආයෙ ම අහන්නට
සීය ගාව ම දැවටි දැවටී සිරිපාදෙ ගැන ගී කියන්නට
සැර වුණත් නිරතුරු පෙමින් බර ඔහුගෙ ළ.මැදට තුරුළු වෙන්නට
සීයාට සෙනෙහසින් කිට්ටු ව ජීවිතේ පාඩම් උගන්නට

කඳුළු ගෙන එන එදා මතකය තරම් නෑ අන් කිසිත් මනරම්
රසබර ද මිහිරියි ද සොඳුරු ද පෙම්සාර ඒ මතක කොතරම්
ගෙවී දුවවිත් අටළොසක් වස් කිම ද වේගය අනේ එතරම්
ඇත්තමයි මට කියාපන් කාලය නපුරු කිමට දැ යි මෙතරම්

## 03. විදුඅරුත් විදු මවුනි

එහි දැහැන පියකරු ය පසඟතුරු නිසසල ය
වැටෙන හිරිපොද මිහිර ආදරය උතුරා ය
අරලියා නා මඬුලු සිප හමා එන සුවඳ
වැළඳගති සුවහසක් කැකුළු පොඩි නො ඉඳුල් ව

වලා මීදුම් පෙරන මහපවුර හන්තාන
ඈත සිළුමිණ දිළෙන අස්ගිරිය මහසෑය
ගලන කරුණා නෙතින් බුදුන් බහිරවකන්ද
නැමී දිය කෙළිනු ම'සබඳ ශිල්ප නදිය මත

අභිනීල අහස් ගැබ සෙනෙහසේ රජදහන
රන්වර්ණ දිනිඳු ඈත බලනු හිනැහෙන අයුර
අරුණැලින් වෙහෙර වට පලාපෙති එති පිබිද
සිංහයින් නද නගති දැනුම ආභරණ කොට

විජය පා සළඹ කොට දහම මිණි කිරුළ කොට
විසුල මහනුවර හිමි අතින් ගත් ඇගෙ වරුණ
අසූ අවුරුදු පොතක මතු ලියෙන පිටු අතර
මේ'පද නිදහන් කරමි සමග නෙත උණු කඳුළ

කෙළිදෙලෙන් පුරාවත වචන'තර සැඟවෙන්න
ගොයුම් මුවමඬල රණ තිසර රද නමදින්න
අනාගතයක සිහින සුසුම'තර මුමුණන්න
නිළමෙවරු හිඳිති මහගිරිදඹය කළඹන්න

# 04. සැඳෑ නුවර

සිරුරෙහි වෙහෙස පිසිමින් මඳ සුළඟ ඇදේ
අහසෙහි පැහැය එහි මුහු වී දියඹ වැදේ
එ'දියෙහි සුවඳ පරමල් හා බැදෙයි තදේ
රසයෙහි නිරාමිස සුව සැනපවෙයි හදේ

අසමින් සිසි නගින කල් තුරුවලින් වියන්
වැසෙමින් නිදයි පුර දොරගුළු කවුළු පියන්
බසිමින් තුරු අගින් සල්මල් දෙඅත තියන්
රහසින් වලා පොරවාගති තුසිත ලියන්

උරමින් තඹ පැහැය අහසෙන් ලිහී එන
දසතින් පිපේ හෙදිරික්කා පුරා වන
එලෙසින් පුදට කල් යල් එළඹැතැයි දැන
බඹසෙන් බසිති පොළොවට පරසතු රැගෙන

කලදෝ පැනින් පැන් සැනැහී කිරි සයුරේ

සුරිදෝ වදිති දළදා හිමි සිරි පවරේ

බිළිදෝ නිදති සුවයෙන් නිදි යහන'තුරේ

තරිදෝ නැගෙති රහසේ අර පෙර අඹරේ

රදමින් වමෙන් ඓරාවණ මහැ'ත් රජ

දකුණින් රැගෙන පින්බර රජු " නැඳුන් " ගජ

සහසැස් සිරස රදවා " රාජා " රාජ

හෙම්හිට වැන්දෝ ය දළදා පිරි තේජ

# 05. මාවත ඉම දෙව් දරුවන්

මාවත ඉම ගල් ටැම් මත හිනැහෙන කොළ පුඬු ඇහිදින
දුහුවිලිවල කිරි සුවඳට පෙණ පිඬු පුබුදා කලතන
රොබරෝසිය මල් මුවරඳ එහි දවටා මුව තවරන
මහ මගබඩ දෙව් දරුවනි විශ්වය දෝතින් හොබවන

මුතු නැති මුත් නෙත මුතු බැඳි අකුරින් හසකින් වි ළිවැස
පඬුපුල උණු වී පිපිරුණු හින්දා සක් රජු නො දුටුව
පා නළියන අත් ලියලන ඇස් කැරකෙන මුව පොපියන
සිහිනය නළවන ඔබ දෙව් දරුවන් විමනෙන් ගිලිහුණ

## 06. මගේ සීයාට සුබ, නිරෝගිවත් උපන් දිනයක් වේවා!

| | |
|---|---|
| හද ගැබ දරා උතුරා ගිය සෙනෙහෙ | ගඟ |
| පියගුණ අරා පවරා ජය මගක | රඟ |
| දෙනුවන් පුරා අතුරා පෙර කරපු | දඟ |
| දිවිතුරු මතක සමරා ඉමි ඔබේ | ළඟ |

| | |
|---|---|
| සිළි සිළි සඳවතුර නද වැදි ගුණ | වරුණ |
| රජ පිළි නැත ද රජු ඔබ හැම දින | තරුණ |
| හිරු එළියයි සඳයි ලේ දා බිඳු | හැරුණ |
| මහවැලි ඔබයි සීයේ ජීවය | පිරුණ |

| | |
|---|---|
| මුළු ලොව අහිමි තැන හිමි ආදර | වදන |
| තව තව සසර පතනෙමි යළි මට | ලැබෙන |
| රෑ දිව හිඳිමි ළඟ ගත දුර වුව ද | දැන |
| සෙත සුව ලැබේවා සීයේ දිනෙන් | දින |

# 07. කළු කුහරයක්

දහසක් දිළිසෙතත් තරු ගොමු මටසිලුටු
හද'හස මැද දැවී ශේෂ ව ඇත පුළුටු
සියුමැලි එළි පවා ගිලගත් පිරුණු කටු
කළු කුහරයක් වාගෙයි එය අඳුරු පටු

සිදුවුණු සුපර්නෝවාවක් යම් තැනෙක
පුපුරා ඉරා මා වට ග්‍රහ මඬුලු නෙක
ආලෝකයේ වේගෙන් මා වෙළුව දුක
නො යනුව සිතින් වෙස් ගෙන සුදු කුහරයක

ජීවිත නෙබියුලාවේ දුහුවිලි බින්දූ
එකිනෙක වියා ප්‍රෝටෝ තරුවක් බැන්දූ
පණ ලත් දොසින් අවටැති ලෝ කැට සන්දූ
පරජම්බුල ගැමා විකිරණ දිවි සින්දූ

සෙනෙහස් ප්‍රතික්‍රියාවෙන් ලත් හුස්ම පොද
මට තරු රටා වී සනසන නිසා හද
ජීවත් වෙමි ලියා දුක නුහුරු ව ම ලද
කළු කුහරයත් තරු උපතත් අතර මැද

## 08. හෙළ උරුම

නුබැදෙන රැදෙන ලෙළැදෙන රන්දද පවුරු
ලියැලෙන නැගෙන පලලන ලිය තුරු අහුරු
නැඟැ එන ඇසෙන රැව් දෙන නද පසඟ තුරු
ඇසැලන දිසෙන වැජැඹෙන නිල් වතු කුඹුරු

වෙල්ලැසි මහතුලෙව් පුලිනැළි ලේ කඳුළු
සිහිලැසි දිය පිරෙව් මහ වැව් ඇදි හුරුළු
මියුලැසි සිරි සදෙව් මැඳුරෙකි මිහි මත ලූ
ඇසිදිසි ලක් පුරෙව් පෙර ලකපති රවුළු

සලු'දුළ කුළුණු ගුණ ලත් අවුකන මුනිඳු
මෙව්නළ වෙළුණු බුදුගුණ දැරි මහ දුමිඳු
ගිරිකුළ නැවුණු තෙදදැරි දළදා සමිඳු
සමනොළ රැඳුණු පා නමදී මෙ'ලක් ළඳු

සිහගිරි දඹුලු ඔද විහිදන අනවරත
නෙක දිරි මඬුලු බඳ විස්කම් අපරිමිත
යස පිරි ළදලු ලෙසි මල් ලිය කම් නො මිත
ආසිරි කඳුළු වෙති නෙත උරුමය මහත

මල්ගොමු සියල් වට මුර දෙව්වරුන් සඟු
නැණසුමු විසල් සහිතැ'ස ගෙන දුන් මහඟු
තොටගමු රහල් මහමෙත් සඳ කුමරතුඟු
හෙළ සමු සඳැල් පියුමන් වට විලසි බිඟු

නවනළු රඟැසි නුත සිව්පැදි සඳැස් කවි
සිව්සළු මියැසි රැදි ජන ගී මිහිර මැවි
පන්සිළු තෙදැසි පා සූසැට රසැලි පෙවි
ලක් මළු රසැසි බල දහසින් නැණුඳු දැවි

රන් සුර පුරෙව් පින් ලත් නිම්හිම් නැවිය
සත්සර රැනෙව් ළං කළ සැනසුම් සවිය
ලක් සර රැසෙව් දිසි අබිමන් රැව් කවිය
ළං කර වරෙව් හදවත දෑ පෙම් අවිය

# 09. හිමියනි...

පන්සලේ බෝ ගසේ පත් නටන තාලයට
සලිත පොකුණක වතුර දඟ කරන ලීලයට
කොහේ දෝ ඉඳන් ආ හිත වෙළූ ආලයට
හිමි මාව නතු වෙලා ඇගෙ සියුම් කෝලයට

ආදරය උගන්නපු දේවතාවියක් ද
ජීවිතය කියාදුන් යශෝ කුමරියක් ද
දුර හිඳින ළඟ නො එන එයා සිහිනයක් ද
මට කියාදෙන්න හිමි ආදරය පවක් ද

සියුම් සිනහව වචන මුතු පටක් වාගෙමයි
දෑසමන් පොට්ටුවක සුවඳ ඇගෙ හිත වගෙයි
ඉඳුනීල නෙතු සඟල නො පෙණුනත් මට ළඟයි
ගොඩක් අය කියනවා ඇගෙ මූණ මං වගෙයි

නිරාමිස සැනසුමක නේරංජනා තෙර
හිමි හිටිය වාගේ ම ඉවත ලා හැම බර
එන්ට මට හිතයි හිටි ගමන් බිඳ භව තිර
එයා හින්දා හිතත් වගේ මහ සමුදුර

මඩ කඩිති කටු පඳුරු ළඳු කැලෑ අතරට
සංසාර අඳුර මැද පහන් දුලබයි මට
දැල්වුණත් ළං නො වෙන පැතුම් දී ම'සිතට
පහන් තරුවක් එයා මගේ හිත් අහසට

සංසාරෙ ආයෙ බෑ අතරමං වෙන්ට නම්
ආ යුතුයි දුවාගෙන හිමිගෙ පාරෙ ම උතුම්
කෝම අත හරින්ට ද එයා මට මං තරම්
සනසන්න අනේ හිමි මාව වතුරෙන් දහම්

# 10. අකල් අනෝරා

රසයෙන් සොම්නසින් නෙත අංජන තවරා
මතු මතු බිඳෙන පැතුමන් සුරැකි ව වපුරා
මා වැහි අනෝරා මැද හිත් අතු පුපුරා
පිපුණේ කිමැයි අකලට මල් ගොමු සකුරා

ප්‍රාණය ඉරී ඉන් වැගිරී ඇත රුහිර
සැනසුම ගෙන එන්න කඳුළැල් දිය දහර
ඔබ යළි එන්න එහි පාවී වී පහුර
උණුහුම ගෙන දෙන්න සිප මගෙ ලේ නහර

දේදුනු ලිහා අහසෙන් පා මුල අතුරා
වනමල් නෙළා සුවඳින් පෙණහළු උතුරා
නුබගැබ වලා වෙත මුළු ජීවය පවරා
හිතවත වහා නිවපන් ගිනි මුල් උදුරා

හෙම්බත් හදවතක් අබලන් හිතක් බර
සිව්මංසලක තනි වී අසරණ ව දුර
මග යන එන අතර හැකි නම් වී නතර
හෙම්බත් හද සිඹිනු මැන ඉස පිණි වතුර

# 11 සුනිල් සාන්තයනට.....

ඹිලු පිපී විල ලෙළදෙනවා අද ඹිලු නටුව අමතක ව ඇත
සීනු නදේ බැඳි ආල කතා ළඟ රසැති රසය අවරට ව ඇත
හීන් සැරේ යළි රිදී වලාවේ වඩින්න කල් යල් පැමිණ ඇත
ඔබ එන තුරු මිහිකත නළවන්නට ස්වරය අනේ යටපත් ඇත

කෝකිලයන්ගේ කෝකිල නාදේ නැවැත හොවාමත අප සවන
අන්න බලාපන් ගයති දෙව්ලියෝ ඔබට වඩින්නට පෙරවදන
ගන්වා මග මල් සුදු හෙළ සාරිය ඔතා මෙ.හෙළ ගීයට හඬන
එම්බා ගංගා පෙරළා ගල්කුළු රන් දියවර ගෙන වඩිනු මැන

සුනිල ළයාදර සුගායනාවන් අමා දයා මිහිරාවෙ හොවා
සාන්ත රසවාහිනී සරසවා රසින් අහස මත රිවිඳු මවා
මල් මල් වාරම් කරන් උදාරම් සෙමෙන් මෙලක දනමනැ දොවා
මෙවන් පිටිසරේ ගයන් අමා ගී ගමන බිඳින් පුහු රසෙහි නිවා

# 12 මුතු වළු පබළු

මුතු වළු පබළු පතුළෙහි සතපවන ලද
නිල් සළු පැටළු රළු නුබ ගැබ නිදන සඳ
මහ ගොළු මුහුදු රළ පෙළ සැඩ නිහඬ මැද
ලොව හෙළුවා එක ම දැහැනෙක සෙමින් තද

මිහිලිය පිරිමදින රළ වැල ගලන විට
පිහි තුඩු අගින් හද කැටයම් කරන විට
එහි සැඟවුණු ලොවෙහි අනියත දහම් ගැට
සිහි කෙරුවේ ය ඔබ කමටහනක් ව මට

දුර නිම්වළලු සිතිජය සමුදුරු පීරා
තර කර හදවතෙහි රැකවල් බැමි දහරා
හරසුන් ලොව පරම සුව රැඳි දිය සීරා
බර වී නෙතින් නික්මිණි මහ මුහුද කරා

## 13 ගී මතින් කවි පෙළක්...

එක යායට පිදුණු මල් බිම් තීරේ නැති වුණාට
පාර දිගේ කොඳුර කොඳුර නො හිටියාට කනින් කනට
රාස්සිගේ අව්වැල්ලට දඹරන් වූ කෙහෙරැළ්ළට
නෙතින් පිදුව පෙම් හසරැල් අද වාගේ මතකයි මට

විකසිත කඩුපුල් මල් හද මත රන් දෙවොලේ මනකල්
ඔබ ම යි රුදු සයුර.ළවැල් මැද මට දොළ දිය සිහිලැල්
නිම්හිම් සෙව් මා සසරේ මා හා බදිනැති අත්වැල්
මගෙ හද තුළ ඔබ ඉන්නැති අතීතයෙන් සොඳුරු නිමල්

පෙනෙනා නො පෙනෙන දුරකින් ඇවිදින් ජීවිතය මතින්
නො කියා ආවත් නවතින්නට සිතුණි ද තෙමුණු සිතින්
ඔබ වෙනුවෙන් හැඬුව තරම් පවසන්නට වරක් නෙතින්
මේ භවයේ නව දවසක් හමු වී සමු ගනිමු ඉතින්

# 14 නො නිඳන මහනුවර

රන්වන් රැසින් දුල<br>
නන් කැන් තෙදින් සුවිසල<br>
එ.තෙදින් නිසන්සල<br>
වදින් සිරැසින් මෙපුර නිකසළ

බඹ සුර නර පෙළිනි<br>
හරසර ලබන නො මදිනි<br>
පුවතර පත විජිනි<br>
මෙනුවරයි සිරිලකට සිළුමිණි

සඳගල වැටෙන තුරු<br>
ඉරගල හෙට නැගෙන තුරු<br>
එක පෙළ හිදිති තරු<br>
මෙ.පුර රැය තුසිතයකි අමයුරු

මන්දාරම්  එතෙන
සිසිලස සෙමින්  මුමුණන
දන මන  පුබුදුවන
මෙ.නුවරට සම මෙලොව කොයි  තැන

මත තඹ පුලුන  තල
සිඹ එහි පුදම් සිත්  මල
සිසිලඹ ඉස  නිමල
වදිනි රන්ටැඹ විසුල  පන්සිල

සුවදැති පිපි  තඹර
මුනි මුව පුදති  දිනකර
නො නිදන  මහනුවර
බලනු විහිදති කිරණ  පැහැසර

## 15 තිත

නෙත යා ව ඉම වෙත නො නිම්
සිත ගාව පැටළී සුසුම්
නැවතුමක නැවතුම සොයම්
නැත අසල සැනසුම උතුම්

තැවී පුපුරා ඉරිතලා
සිත් පියුම් කවුරු ද තලා
කඳුළට ම රොන් පිඬු හෙළා
තැවෙමි මොහොතක් ඉසුඹුලා

රන් දෙවැට අත්වැල් ළඟ
ඇළ දොළ ද ගඟදිය දඟ
සැම ඇදෙති පා තුටු රඟ
මා කිම් ද තවමත් මඟ

හෙම්බත් ව ඇත ආ දුර
යා යුතු ය හැර මේ පුර
අවැසි ම යි සැනසුම තර
බිමලන්න හිසරඳ බර

නො ඇසේ ය ළතැළුණු සවන්
නො දැනේ ය සැනසුම් පවන්
පෙඟවේ ය මිලින ව නුවන්
දෙනු මැනැවි හිමි මට නිවන්,

විකසිත ව යළි සත් පියුම්
ගෙන පිරූ සමතිස් පෙරුම්
සුව රැගෙන ලොවට ම නැවුම්
එනව නම් සිදුහත් ගොයුම්

කටු ඉරුණු පා මල් මත
පියවමින් එමි මා නෙත
හිමි නිවනු මැන මා සිත
මම පතමි සසරෙහි තිත

# 16 සුදු වැලි තලා

පවනැලි වෙළෙන පත් නැටවෙන රුන ඇසතු
සිලි සිලි නද රදන සක්වළ සැර දහස් එතු
කඳුළැලි නිවා සක්වළ සැට දහස් මතු
සුදු වැලි තලා මත හිමි පැතු

සිරිසර අක්බඹර කෙස් රොද සිසිල් නිල
පින්බර බඳු තඹර අභිනිල් නෙතු සඟල
සොම්කර කැලුම් පිසිනා රන් පා කමල
මෙ.සසර කතර මහමෙව්නාවයි නිමල

සහසක් උතුම් පිණි මුතු කැට වැටෙන බිම
අහසක් ගිගුම් පා සුරසෙන් වදිති සම
රහසක් කියම් එදවස මුළු දඹදිව ම
දහසක් පියුම් පිපුණා සේ විය උවම

නෑණ සෙන් වටින් බිඳ තණ්හා කෑණිමඬල
රණ හඬ පා මිහඹ එළි කළ රිවිමඬල
දණ හා එති කලල් විල සේ පියමඬල
අණසක පා කිරුළ ලත් මෙ. සසරමඬල

දුකඳුරු වනේ ගිරිහිස් සිප නැගුණි සඳ
සැනැසුම දැනේ හිමිරුව ළඟ මට නො මඳ
දෙව්රම් වනේ සැනැසෙන්නට දහම් විඳ
හිමියනි අනේ කිම මට පින වුණේ මඳ

ගිනිදැල් දහක් මැද සිත්තම් කව් පබැඳේ
ඉඳුරන් පහක් හා හරඹෙක වෙමි නිබඳේ
ඊළඟ වෙසක් පෝදා නිල් සිල් සුවඳේ
එකමෙක වරක් මා වෙත එනු මැන සමිඳේ

බිඳුවෙන් බිඳුව මහමෙර දිය කරවන්න ම්
අඩියෙන් අඩිය හිමි ගිය මග පැමිණෙන්න ම්
ගඬොලින් ගඬොල ගළවා ගෙය බිමලන්න ම්
පදයෙන් පදය දහමින් මම සැනසෙන්න ම්

# 17 එදා කුසිනාරාවේදී

හිමිල දැවේ මුළු ලොව ම
නිසන්සල කිම ද ඔබ
සැලෙයි කුසිනාරාව
කිම ද ඔබ පියා නෙත

නිසල වුවනත පුරා
නිමල රශ්මිය ගලා
විහිදේ ය ෂඩ් වර්ණයන්..
බුද්ධානුභාවයෙන්
සත්‍යානුභාවයෙන්
වියෝ සන්තාපයෙන්
කම්පිත ය මිහිතලය..

" වයධම්මා සංඛාරා
උප්පාද වයධම්මිනෝ "
හිමි
සැලෙති සල් උයන
නිහඬ ව ම ඇයි තවම
දැවෙති පුහුදුන් දනෝ
සුසුම් උසුළා විසුල

දෙව් බඹුන්

නිහඬ විය සියල්ල...

නො පෙනේ යල නො දැනේ ය සියල්ල...

සම්මා සමාධියෙන්

ලැබුවා ද ඔබ අගතැන

ලබන්නට හැකි උත්තුංග ම සමාධිය ?

හිමි ඔබ ලැබුවා ද

අනුපාදිසේස නිබ්බාණය

හිමි...

මා තනි වී..

හිමිල ලොව බිඳුණි..

හිමිල සියල්ල නැසී ගියෙන්ල

හුදෙකලා ය ඔබ සිරි දේහය

මා අබියස...

නිහඬයි හැම..

නිහඬයි..

ඇසෙන එක හඬක් හැර

"ආනන්ද, නො හඬන්න,

අනිච්චාවත සංඛාරා"

අනිච්චාවත සංඛාරා..හැරගියා භගවතාණෝ,

සියල්ල ම, ගෙවුණු සැණේ දී...

# 18 ජීවිත නෙබියුලාවේ

දහසක් දිළිසෙතත් තරු ගොමු        මටසිලුටු
හද'හස මැද දැවී ශේෂ ව ඇත        පුළුටු
සියුමැලි එළි පවා ගිලගත් පිරුණු        කටු
කළු කුහරයක් වාගෙයි එය අඳුරු        පටු

සිදුවුණු සුපර්නෝවාවක් යම්        තැනෙක
පුපුරා ඉරා මා වට ග්‍රහ මඬුලු        නෙක
ආලෝකයේ වේගෙන් මා වෙළුව        දුක
නො යනුව සිතින් වෙස් ගෙන සුදු        කුහරයක

ජීවිත නෙබියුලාවේ දුහුවිලි        බින්දූ
එකිනෙක වියා ප්‍රෝටෝ තරුවක්        බැන්දූ
පණ ලත් දොසින් අවටැති ලෝ කැට        සන්දූ
පරජම්බුල ගැමා විකිරණ දිවි        සින්දූ

සෙනෙහස් ප්‍රතික්‍රියාවෙන් ලත් හුස්ම        පොද
මට තරු රටා වී සනසන නිසා        හද
ජීවත් වෙමි ලියා දුක නුහුරු ව ම        ළද
කළු කුහරයත් තරු උපතත්        අතරමැද

# 19 ජය මහ දුමිඳු මුල

දුර තැනිතලා සිප පිසලා පුලින මළු
පවනැලි ගලා එයි නැළැවෙයි පහන් සිළු
මුදු සුදු වලා නිසසල කර තරඟ රළු
නිකසල කලාවෙන් සැනසෙයි ළපළු දළු

සිළුමිණි රශ්මි මාලාවන් ගිගිරි සල
කිංකිණි සළඹ ලා දෙව් සෙන් තෙද විසුල
මුතු පිණි පත් අගිසි අතරින් පෙරා නල
බැබැළිණි ගයාවේ සිරියෙන් කුමුදු තල

ගොරසැඩි රුදුරු ගොර මර ඔද තෙද සිදෙනී
මිරිවැඩි සඟ මුදා සක්පති සිඹ වදිනී
සැඩි දැඩි සුළඟ නැවැතී ඉසි මල් කිනිනී
මෙහි වැඩි වගයි සක්වළ එක මිටට එනී

අහසින් උදුළ නො මිනිත තරු පිරිවරිනී
රහසින් වෙළී කඩුපුල් මල් හා පෙමිනී
සහසින් බැඳී නිසයුරු නුමුදා ළඟිනී
පහසින් දිවා නො කෙරෙති කිසි ලෙසිනි තනී

සිදුහත් ගොයුම් පා තඹරින් සෙමර සල
සිව් සත් දහම් රුවනින් අක්බඹර නිල
බෝ පත් නැවුම් හිනැහෙති අතු අගිසිවල
අහසත් සියුම් විය ජය මහ දුමිඳු මුල

# 20 කොළොම්තොට අහස යට

එපා වුණු දුරු ගමන නිශාවෙක විඩාබර
සරා සඳ සිනාසෙන කොළොම්තොට අහස යට
නිදා වැටෙනා දනන් සිත් ඉරා කිණිසි ගෙන
යකඩ කඳ නද නගයි එන රිසින් නුවර වෙත

ළඟ කවුළුවක් වේ ය හමන් සිසිලක් නොමැත
අසල මිනිසුන් බෝ ය නෙත් විඩා උතුරා ය
සෙනේහය මිදී ගල් ගැසුණු හදවත් බෝ ය
අරමුණක් විරහිත ව පද අහුරු ලියැවේ ය

වට ගැසුණු පිටකොටුව රස්නෙ ගන බස් පොළෙහි
සිඟාකන මිනිස්කම බේරේ ය රෙදි පල්ලෙ
ආලෝක තිර අරා නැවුණු නෙතුපිය අතරෙ
අසමසම තනිකමකි කුළුණු තැවරෙති අහසෙ

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරුපසක් සැකසීම සමාජ වගකීමයි

පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප පළාත් ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය දියණියන් ගුරුභවතුන් දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්

වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණීය යුගයේ ස්මාට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි තම නිර්මාන ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක
සෙනෙවිරත්න මහලේකම්

පිටින් ලබන සියල යහපතැයි
මුදුනින් නැමැඳ පිළිගෙන
සියබස ද, එහි ගැබ් වැ ඇත්තා වූ අනුපමේය
භාෂාමය ගුණාංගයන් ද
නො තකා හරින අද්‍යතන අවිචාරවත්
පාඨක කැළට මුහු නො වී
සියබසෙහිත්, අන් බස්වලත් ඇති උතුම් තැන්
ග්‍රහණයට,
ඉගැනුමට වැර යොදන
සැබෑ නැණවත් සහෘද " සබඳ " ඔබ,
බස සුරකින මෙහෙවරට එක් විය යුතු යැ.
මන්ද යත්, බසක් නැති තැන සමයක් ද,
දැයක් ද, රටක් ද ඉතිරි නො වන හෙයින් මැ.